# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2204/18 - 2020 දෙසැම්බර් මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2020.12.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ මීගමුව මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසි කිරීම හේතුකොට ගෙන මීගමුව මහ නගර සභාවට තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ මීගමුව මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ වෙලප්පුගේ දොන් ලලිත් ටෙන්සිල් අයත් වන්නා වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම මීගමුව මහ නගර සභාවට තෝරා එවා ඇති සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා මිහිදුකුලසූරිය එමිල් රෝහන් ප්‍රනාන්දු නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මීගමුව මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරි, කරුණාසිංහ ජයරත්නගේ සම්පත් මාධව වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් මිහිදුකුලසූරිය එමිල් රෝහන් ප්‍රනාන්දු, මීගමුව මහ නගර සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**කේ. ජේ. එස්. මාධව,**
තේරීම්භාර නිලධාරි,
මීගමුව මහ නගර සභාව.

2020 දෙසැම්බර් මස 02 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගම්පහ.

12 - 315

1A - G 33304 — 35 (2020/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*